
# 6 ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික උරුමය

මෙම පාඩමෙහි අන්තර්ගතය වනුයේ බුද්ධ ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ සංස්කෘතික උරුමයත් ය. වසර දෙදහස් පන්සිය පනහක් පමණ පැවැත එන ශාසනයෙහි ඉතිහාසය මෙබඳු කෙටි විස්තරයකින් දැක්වීමට නො හැකි වුවත්, එහි ඉතා වැදගත් සිද්ධි අතරට එකතු වන ධර්ම සංගායනා පිළිබඳ කෙටි විවරණයක් පළමුවන ඒකකයෙන් ද, ශ්‍රී ලාංකික බෞද්ධ කලා ශිල්ප පිළිබඳව කෙටි හැඳින්වීමක් දෙවන ඒකකයෙන් ද, ශ්‍රී ලංකාවේ බෞද්ධ සාහිත්‍යය පිළිබඳ ව සටහනක් තෙවන ඒකකයෙන් ද ඉදිරිපත් කරනු ලැබේ.

## 6.1 ධර්මසංගායනා

### 6.1.1 හැඳින්වීම

සංගායනා යන වචනයෙහි අදහස 'එකට එක්වී ගායනා කිරිම' යනු යි. බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය හා පනවන ලද විනය භික්ෂූන් වහන්සේලා එක්වී ගායනා කිරීම ඉන් අදහස් කෙරේ. බුද්ධ වචනය එකට එක් ව කීමෙහි අදහස වූයේ සියලු දෙනා වහන්සේ තමන් සංගායනා කළ ධර්මය හා විනය නියම බුද්ධ වචනය ලෙස ප්‍රසිද්ධියේ පිළිගැනීමයි. එසේ කිරීමට අවශ්‍ය වූයේ කිසියම් ගැටලු සහගත තත්ත්වයක් පැවැති අවස්ථාවක ය.



ථේරවාද බෞද්ධ සම්ප්‍රදායයේ ඉතිහාසය තුළ සංගායනා හයක් පිළිබඳ ව සඳහන් වේ. ඉන් පළමු සංගායනා තුන ඉන්දියාවේ ද, සිවුවැන්න ලංකාවේ ද, පස්වන හා හයවන සංගායනා මියන්මාර (බුරුම) රටෙහි ද පවත්වා ඇත.

පළමු සංගායනාව බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසකට පසු රජගහ නුවර ද, දෙවැන්න බුද්ධ පරිනිර්වාණයෙන් සිය වසකට පමණ පසු වෛශාලී නගරයෙහි ද, තෙවැන්න අශෝක අධිරාජයා දවස පාටලී පුත්‍ර නගරයෙහි ද පවත්වන ලදී. සිවුවන සංගායනාව ක්‍රිස්තු වර්ෂාරම්භයේ දී වළගම්බා රජු සමයෙහි මාතලේ ආලෝක (අලු) විහාරයෙහි පවත්වන ලදී. (ඉන්දීය ඉතිහාසයේ සංගායනා පිළිබඳ විස්තර කරන විට සිවුවන සංගායනාව ලෙස දක්වන්නේ කණිෂ්ක රාජ සමයේ සිදු කළ සංගායනාවයි.) පස්වැන්න 1871 දී මින් දොන්මින් රජුගේ කාලයෙහි ද, සයවැන්න 1954 1956 අතර කාලයෙහි ද මියන්මාරයෙහි දී පවත්වන ලදී. මෙම පාඩම් ඒකකයෙන් අපි ලංකාවේ පැවැත්වූ සිවුවැනි සංගායනාව හෙවත් අලුවිහාර සංගායනාව පිළිබඳ ව කරුණු හදාරමු.

## 6.1.2 අලුවිහාර සංගායනාව

ථේරවාද ඉතිහාසයෙහි සතරවන සංගායනාව ලෙස සැලකෙන්නේ වළගම්බා රජු දවස (ක්‍රි:පූ. 89  77) මාතලේ අලු විහාරයේ දී පවත්වන ලද පුස්තකාරූඪ සංගීතියයි. එනම් ත්‍රිපිටකය පොත්වල ලියා තැබීමයි. මෙහි දී සැබවින් ම සිදු වී ඇත්තේ මහා සංඝ රත්නය ත්‍රිපිටකය සංගායනා කිරීමකට වඩා එතෙක් මතකයෙන් පවත්වා ගෙන ආ ධර්මය පුස්කොළ පොත්වල ලියා තැබීමයි. වළගම්බා රාජ්‍ය යුගය වන විට රටට හා බුදුසසුනට නරක කල දශාවක් ලබමින් තිබුණි.

වළගම්බා රජු මුලින් ම රජ බවට පත් ව (ක්‍රි:පූ. 103) මාස පහක් ගතවීමටත් පෙර තිස්ස නම් බ්‍රාහ්මණයෙක් රජුට විරුද්ධ ව කැරැල්ලක් රුහුණෙහි ආරම්භ කළේ ය. ඒ සමග ම දකුණු ඉන්දියාවෙන් පැමිණි දෙමළ ආක්‍රමණිකයන් සත් දෙනෙකු විසින් ලංකා රාජ්‍යය අල්ලා ගැනීම ද සිදුවිය. මෙම කාලයේ දී එක් පැත්තකින් තිබූ තිස්ස බමුණාගේ කැරැල්ලෙන් ද අනිත් පැත්තෙන් තිබූ විදේශීය ආක්‍රමණයෙන් ද සසුනට ද රටට ද විශාල පීඩාවක් විය. එහෙත් ඒ සියල්ලට ම වඩා වසර 12ක් තිස්සේ දෑඩි නියඟයකින් මුළු රටට ම පීඩා විඳීමට සිදුවිය. මෙම නියඟය සමග ඇති වූ සාගතයෙන් විශාල පිරිසක් නිරාහාර ව කුසගින්නෙන් මිය ගියහ. බොහෝ භික්ෂූහු ද එසේ මරණයට පත්වූහ. භික්ෂූන් පෝෂණය කිරීමට ගිහි ජනයාට නොහැකි විය.

තවත් බොහෝ  භික්ෂූන් වහන්සේලා දිවි රැක ගැනීම සඳහා අසල්වැසි රටවන ඉන්දියාවට වැඩියහ. ධර්මය කට පාඩමින් දත් බොහෝ භික්ෂූහු ද මෙසේ ගිය පිරිස අතර වූහ. සමහර භික්ෂූන් වහන්සේලා කෙසේ හෝ මෙ රටෙහි රැඳී සිටිමින් ධර්මය ආරක්ෂා කිරීමේ අධිෂ්ඨානයෙන් ක්‍රියා කළහ. වසර දොළහකට පසු නියඟය හා සාගතය අවසන් ව රට යථා තත්ත්වයට පත් වූ පසු විදේශගත වූ භික්ෂූහු ද ආපසු පැමිණියහ. දිවයිනේ නතර ව සිටි භික්ෂු පිරිස හා නැවත පැමිණි භික්ෂූන් එකිනෙකා මුණ ගැසී තම තමන්ගේ කට පාඩම සන්සන්දනය කළ අතර, එහි කිසිදු වෙනසක් නොවූ බව දැක සතුටට පත්වූහ. එහෙත් මෙම දුර්භික්ෂය හේතුවෙන් ධර්මය කට පාඩමෙන් පමණක් පවත්වා ගෙන ඒමේ අවදානම ගැන භික්ෂූන් වහන්සේලාට හොඳින් වැටහී ගියේ ය. සමහර ධර්ම ග්‍රන්ථ කටපාඩමින් දැන සිටියේ එක භික්ෂූන් වහන්සේ නමක් හෝ කීප නමක් පමණි. උන්වහන්සේලාත් අපවත් වූවාහු නම් එම ග්‍රන්ථය සඳහට ම නැති වීමට ඉඩ තිබිණි. ධර්මය ග්‍රන්ථාරූඪ කිරීමේ (පොත්  පත්වල ලිවීමේ) අවශ්‍යතාව ඉතා තදින් දැනෙන්නට විය.

එහෙත් මෙහි දී ගැටලුවක් වූයේ වළගම්බා රජු මහාවිහාරිය සංඝයා සමග සිත් අමනාපයකින් පසුවීමයි. එයට හේතු වූයේ වළගම්බා රජු අභයගිරි විහාරය කරවා එය තමන්හට යුද සමයේ දී පිහිට වූ මහාතිස්ස නම් භික්ෂුවහන්සේ නමකට පෞද්ගලික පූජාවක් ලෙස පූජා කිරීම මහාවිහාරීය භික්ෂූන් විසින් අනුමත නො කිරීමයි. එසේ පිළිගැනීමේ වරදට දඬුවම් වශයෙන් මහාවිහාරීය සංඝයා විසින් රජුගේ හිතමිත්‍ර මහාතිස්ස හිමියන් සංඝ සමාජයෙන් ඉවත් කරන ලදී. රාජ්‍ය  අනුග්‍රහය ද ඇති ව සිටි මහාතිස්ස හිමියෝ තම ශිෂ්‍ය පිරිස ද සමග මහාවිහාරයෙන් වෙන් ව වෙන ම කොටසක් ලෙස ක්‍රියා කිරීමට පටන් ගත්හ. මෙසේ ලක්දිව පළමු නිකාය භේදය සිදු වූ අතර ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ මහාවිහාරීය භික්ෂූන්ගේ කාර්යයට රජුගේ සහයෝගය නො ලැබිණි. ඒ අනුව ශාසන ඉතිහාසයෙහි ඉතා තීරණාත්මක මෙම සංගායනාව අනුරාධපුරයෙන් දුර බැහැර කඳුකර මාතලේ ප්‍රදේශයෙහි අලු විහාරයෙහි දී එක්තරා ප්‍රාදේශීය නායකයකුගේ අනුග්‍රහයෙන් පවත්වන ලදී.

ධර්මය පළමු වරට ලේඛනගත කිරීමට ලංකාවේ මහා විහාරීය සංඝයා ගත් තීරණය බුද්ධ ශාසන ඉතිහාසයෙහි අතිශයින් වැදගත් සන්ධිස්ථානයක් විය. ලෝකයෙහි විවිධ රටවල බුද්ධ ශාසනය විවිධ කම්කටොළුවලට භාජන වෙමින් ඇතැම් විට විනාශ ද වුවත් ත්‍රිපිටක ධර්මය විනාශ නොවී ලංකාවෙහි ආරක්ෂා වීමට මෙම දූරදර්ශී පියවර හේතු විය. පොළොන්නරු මහා විජයබාහු රජු

සමයෙහි දී මෙම ත්‍රිපිටකය මියන්මාර රටට ගෙන යන ලදුව එහි ආරක්‍ෂා විය. එහි සිට එය අනිකුත් ථේරවාද රටවල් වන තායිලන්තය, ලාඕසය හා කාම්බෝජයට ද ගෙන යන ලදී.

19 වන සියවසෙහි අග ලංකාවේ සේවය කළ බ්‍රිතාන්‍ය සිවිල් නිලධාරියකු වූ රීස් ඩේවිඩ්ස් මහතා (1843 1922) මෙහි සිට පාලි භාෂාව ඉගෙන නැවත එංගලන්තයට ගොස් **පාලි ග්‍රන්ථ සමාගම** (Pali Text Society) 1882 දී එහි පිහිටුවා මෙම පාලි පොත් ඉංග්‍රීසි අකුරෙන් මුද්‍රණය කොට බෙදා හැරීම ආරම්භ කළේ ය. අද වන විට මුළු ලොව පුරා ථේරවාද බෞද්ධ ග්‍රන්ථ පැතිර ඇත්තේ වළගම්බා රජු දවස ලංකාවේ භික්ෂූන් වහන්සේලා විසින් ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමෙන් ඉටු කළ ඓතිහාසික කාර්යය නිසා බව කිව හැකි ය.

## 6.1.3 සාරාංශය

බෞද්ධ ශාසන ඉතිහාසයෙහි ආරම්භක සියවස් පහක කාලය තුළ සිදු කරන ලද මෙම සංගායනා ශාසනයෙහි යහ පැවැත්ම සඳහා ඉවහල් වූ අයුරු මේ අනුව පැහැදිලි වේ.

### අභ්‍යාස

1. අලුවිහාර සංගායනාව ශාසනික වශයෙන් වැදගත් බවට ඔබ දක්වන කරුණු සඳහන් කරන්න.

### පැවරුම්

1. පළමුවන සංගායනාවෙන් බුද්ධ වචනය පිටක වශයෙන් දෙකකට බෙදා වෙන් කළ අයුරු ඔබ දන්නෙහි ය. එම එක් එක් පිටකයට අයත් ග්‍රන්ථවල නම් සොයා දක්වන්න.
2. තෙවැනි සංගායනාවෙන් පසු අශෝක රජු විසින් ධර්මදූතයන් යවන ලද රටවල් / ප්‍රදේශ නම් කරන්න.
3. ස්ථවිර භික්ෂුව යනු කවරෙක්දැයි ඔබගේ ගුරුවරුන්ගෙන් අසා සටහන් පොතෙහි ලියා ගන්න.
4. පහත සඳහන් වචනවල තේරුම් සොයා පොතට එකතු කර ගන්න.
   i. බුද්ධ වචනය ii. බුද්ධ දේශනාව iii. විනයානුකූල
   iv. පක්ෂපාතිත්වය v. දුර්භික්ෂය vi. නිකාය භේදය
5. අනුරාධපුරයෙහි මහාවිහාරය හා අභයගිරිය පිළිබඳ ව කරුණු සොයා සටහන් පොතට එකතු කරන්න.

## 6.2 මහින්දාගමනයේ දායාද: බෞද්ධ කලා ශිල්ප

### 6.2.1 හැඳින්වීම

මහින්දාගමනයෙන් ශ්‍රී ලංකාවට ලැබුණු දායාද අතර බෞද්ධ කලා ශිල්ප මූලික ස්ථානයක් ගනී. මිහිඳු හිමියන් ලක්දිවට වඩින විට මෙහි දියුණු කලා සම්ප්‍රදායක් වූ බවට සාක්ෂ්‍ය නැත. ඉන්දියාවේ දියුණුව පැවැති සාහිත්‍යකලාවන්ගේ බලපෑම අපට සෘජුව ම ලැබුණු අවස්ථාවක් නම් මහින්දාගමනයයි. අශෝක අධිරාජයාගේ අනුග්‍රහය යටතෙහි මෙහි පැමිණි ධර්මදූත කණ්ඩායමෙහි නායකත්වය එතුමාගේ ම පුත් මිහිඳු හිමියන් විසින් උසුලනු ලැබීම මෙම බලපෑම සඳහා තීරණාත්මක සාධකයක් වන්නට ඇත. ශ්‍රී මහා බෝධි ශාඛාව සමග එහි ආරක්ෂාව සඳහා එවන ලද පිරිවර ජනයාට අමතර ව සියලු ශ්‍රේණිවලට අයත් කලා ශිල්පීන් ද ධර්මාශෝක රජතුමා විසින් එවන ලද බව ඉතිහාසයෙහි සඳහන් වේ. දියුණු මට්ටමක පැවැති ඉන්දීය කලා සම්ප්‍රදායයේ හා ශිල්ප ශාස්ත්‍රවල බලපෑම අප රටට මේ අයගෙන් ලැබෙන්නට ඇත.

බුදුදහමේ බලපෑම යටතේ ශ්‍රී ලංකාවේ දියුණු වූ කලාවේ මූලික අංග වනුයේ ස්තූපය හා එහි උපාංග වන වාහල්කඩ, වටදාගෙය, කොරවක්ගල, මුරගල්, සඳකඩ පහණ වැනි නිර්මාණත්, මූර්ති, කැටයම් හා චිත්‍රත් ය. මූර්ති යනු අඹන ලද හෝ නෙළන ලද මනුෂ්‍ය හෝ සත්ත්ව රූපයි. මූලික වශයෙන් බෞද්ධ කලාව තුළ බුද්ධ ප්‍රතිමාව ද, දොරටුපාල රූප ආදිය ද මේ සඳහා නිදසුන් ය. කැටයම් ගණයට අයත් වන්නේ අර්ධ වශයෙන් මතුවන සේ නිර්මාණය කොට ඇති කලා කෘති ය. සඳකඩ පහණ මේ සඳහා නිදසුනකි. අඳින ලද කලා කෘති චිත්‍ර ගණයට වැටේ.

“කලා ශිල්ප” යන්නෙහි සඳහන් ශිල්ප වෙන ම ගතහොත් අනාදිමත් කාලයක් තිස්සේ අප රටෙහි දියුණු වී ඇති රන්, රිදී, තඹ, පිත්තල හා යකඩ කර්මාන්ත, වඩු කර්මාන්තය, මෝස්තර හා අලංකාර කිරීම්, රෙදි විවීම, පැදුරු විවීම, මැටි කර්මාන්ත, ලාකඩ කර්මාන්ත ආදී කලාත්මක බවට මුල් තැනක් දුන් කර්මාන්ත රාශියක් වන බව ද සඳහන් කළ යුතු ය.

මෙම පාඩම් ඒකකයෙන් අපට මේ සියල්ල සාකච්ඡා කළ නො හැකි බැවින් අප රට බෞද්ධ කලාවෙහි ප්‍රධාන අංග වන ස්තූපය, බුදු පිළිමය, සඳකඩ පහණ හා චිත්‍ර පිළිබඳ පමණක් කෙටි හැඳින්වීමක් කරනු ලැබේ.

### 6.2.2 ස්තූපය

ස්තූපය යනු සාමාන්‍යයෙන් බුදුරදුන්ගේ ශාරීරික ධාතු හෝ වෙනත් පූජනීය වස්තු නිදන් කොට තනන ලද්දකි. ශ්‍රාවකයන් වහන්සේ නමක් වෙනුවෙන් භෂ්මාවශේෂ තැන්පත් කොට ස්තූප ගොඩනංවා ඇත. ගෘහනිර්මාණ ශිල්පයට අයත් වුවත් ස්තූපය යනු ගෘහයක් නොවේ. එය බෞද්ධාගමික කලා කෘතියකි. බෞද්ධ ඉතිහාසයෙහි පැරැණි ම ස්තූප ගැන සඳහන් වන්නේ බුදුරදුන් දවස ය. සැරියුත් මුගලන් අගසවු දෙනම පිරිනිවන් පෑ විට උන්වහන්සේලාගේ ධාතු නිදන් කොට ස්තූප කරවන ලද බව ධර්මයෙහි සඳහන් ය. බුදුරදුන් පිරිනිවන් පෑ පසු උන්වහන්සේගේ ධාතු අට කොටසකට බෙදා ඒවා තැන්පත් කොට ස්තූප කරවන ලද බව සඳහන් වේ. ලංකාවේ මුල් ම ස්තූපය ලෙස මහාවංශයෙහි සඳහන් වන්නේ බුදුරදුන් මුල්වරට ලංකාවට වැඩම කළ කල්හි ඉදි කරන ලද මහියංගන චෛත්‍යයයි. මහින්දාගමනයෙන් පසු තනවන ලද මුල් ම ස්තූපය වූයේ අනුරාධපුරයෙහි ථූපාරාම ස්තූපයයි. ලංකාවෙහි ස්තූප අතර සුප්‍රකට ම වන්නේ දුටුගැමුණු රජතුමා විසින් කරවන ලද රුවන්වැලි මහ සෑයයි. (දුටුගැමුණු රජු පිළිබඳ පාඩම් ඒකකය බලන්න.)

ස්තූප යන්න හා සමාන ලෙස චෛත්‍යය, සෑය හා දාගැබ යන වචන ද භාවිත කරනු ලැබේ. ධාතු ගර්භය හෙවත් ශාරීරික ධාතු නිදන් කළ ස්ථානයට සිංහලෙන් දාගැබ යැයි කියනු ලැබේ.

චෛත්‍යය යනු සංස්කෘත වචනයකි. එයට පාලියෙන් චේතිය යනුවෙන් ද සිංහලෙන් සෑය යනුවෙන් ද ව්‍යවහාර වේ. චේතිය යන්න ස්තූපය හා සමාන ලෙස භාවිත කළත් ඉන් මූලික ව ම අදහස් කෙරෙන්නේ පූජනීය වස්තුවකි. අප නිතර භාවිත කරනඃ


> **වන්දාමි චේතියං සබ්බං — සබ්බඨානේසු පතිට්ඨිතං,**
> **සාරීරිකධාතු මහාබෝධිං — බුද්ධරූපං සකලං සදා.**

යන ගාථාවෙහි ("මම සෑම තැන්හි පිහිටි සියලු චෛත්‍ය සැමදා වඳිමි. එනම් ශාරීරික ධාතු, මහාබෝධිය හා බුද්ධ රූපය යි.") චේතිය යන්නෙන් අදහස් කොට ඇත්තේ බුදුරදුන්ගේ ශාරීරික ධාතු, බෝධීන් වහන්සේලා හා බුදුපිළිම ද වේ.

විහාරස්ථානයකට ගොස් වැඳීමේ දී නිවැරැදි පිළිවෙළ වන්නේ මුලින් ම ශාරීරික චෛත්‍යය වන ස්තූපයටත්, දෙවනුව පාරිභෝගික චෛත්‍යය වන (බුදුරදුන් බුදුවීම සඳහා පිටදීමෙන් පරිභෝග කළ) බෝධියටත්, අවසන උද්දේසික (බුදුරදුන් උදෙසා කරන ලද) චෛත්‍යය වන බුදු පිළිමයටත් වැඳීම යි. මේ අනුව ස්තූපය බෞද්ධ පූජනීය ස්ථාන අතර මුල් තැන ගනී.

කලාකෘතියක් ලෙස ගත් විට ස්තූපය මනා සැලැස්මක් ඇති ව නිර්මාණය කරන ලද්දකි. එහි මුලින් ම පේසා වළලු තුනක් ද (මල් තැන්පත් කිරීමට තනන ලද වේදිකා), ඉන්පසු ගර්භය ද ඉන්පසු හතරැස් කොටුව, දේවතා කොටුව, කොත් කැරැල්ල, කොත හා සිළුමිණ යන අංග ද ඇත. (ආකෘති සටහන බලන්න.) ස්තූපය සලපතළ (ගල්) මළුවක පිහිටා ඇති අතර, ඊට පහළින් වැලි මළුවක් ද ඇත. ස්තූපය සතර පැත්තෙහි **වාහල්කඩ** (ආයක) සතරක් ඇත. සමහර ස්තූප **වටදා ගෙය** නමින් හැඳින්වෙන ආවරණයකින් වසනු ලැබ ඇත.

ඉහත සඳහන් අංග සහිත ව ස්තූපය නිර්මාණය කොට ඇත්තේ ආගමික අර්ථයක් දීමට බව පෙනේ. බෞද්ධයකු තම ආගමික ජීවිතය ක්‍රමයෙන් දියුණු කොට අවසානයේ දී එහි මල්පල ගැන්වීම ලෙස නිවනට පත්වීම පේසාවළලුවල සිට චූඩාමාණික්‍යයෙන් අවසන් වන ස්තූපයෙන් නිරූපණය කරන බව සඳහන් කළ හැකි ය. වැවෙන් දාගැබෙන් හා කුඹුරෙන් සංකේතවත් වූ අප ඉපැරැණි සංස්කෘතියෙහි ආගමික (ආධ්‍යාත්මික) දියුණුව සංකේතවත් කළේ ස්තූපයෙනි.




ස්තූපය නිර්මාණය කොට ඇත්තේ කිසියම් ආකෘතියකට හා ශිල්ප ක්‍රමයකට අනුව ය. එම ශිල්ප ක්‍රමය මෙහිදී අප සාකච්ඡා කරන්නේ නැත. ස්තූපයක ආකෘතිය සය ආකාරයකින් දක්වා ඇත. i. ඝණ්ඨාකාර (සීනුවක් වැනි), ii. ඝටාකාර (කළයක් වැනි) iii. බුබ්බුලාකාර (දිය බුබුලක් වැනි) iv. ධාන්‍යාකාර (ධාන්‍ය ගොඩක් වැනි) v. පද්මාකාර (පියුමක් වැනි) හා vi. ආමලකාකාර (නෙල්ලි ගෙඩියක් වැනි) යනුවෙනි. රුවන්මැලි සෑය බුබ්බුලාකාර ව ඉදි කරන ලද බව කියැවේ. මීට අමතරව විවිධ බෞද්ධ රටවල වෙනස් ආකෘති ද පවතී.



වටදාගෙය

**වටදාගෙය හා වාහල්කඩ:** ස්තූපයක ආරක්ෂාව සඳහා එය වට කොට තනනු ලබන ගොඩනැගිල්ල "වටදාගෙය" (චෛතියඝර) නම් වේ. ථූපාරාමයෙහි එබඳු වටදාගෙයක් තිබූ බවට ලකුණු ඇත. අතිවිශාල ස්තූප සඳහා මෙම ගොඩනැගිල්ල ඉදි කොට නැත. දැනට මුළුමනින් ම නටබුන් නොවී ඉතිරි ව ඇති කලාත්මක ම වටදාගෙය ඇත්තේ මැදිරිගිරියෙහි ය. වටදාගෙය පිළිබඳ නූතන නිදසුනක් නම් කලුතර බෝධිය අසළ ඇති ස්තූපය වට කොට ස්තූපයක ආකාරයෙන් ම නිර්මාණය කොට ඇති චෛතියඝරය යි. වාහල්කඩ යනු ස්තූපයක සතර පැත්තේ දක්නට ඇති තොරණක් වැනි අලංකාර කැටයම් සහිත නිර්මාණයකි. මෙය ද සෑම ස්තූපයක ම දක්නට නැත. ලංකාවට ආවේණික නිර්මාණයක් ලෙස සැලකිය හැකි මෙය අලංකාරය හා ස්තූපයෙහි ආරක්ෂාව සඳහා ද වේ.

### 6.2.3 බුදු පිළිමය



බුදුරදුන් සංකේතවත් කිරීම සඳහා බුදුපිළිමයක් නිර්මාණය කිරීමට බෞද්ධයන් පෙළඹුණේ කලක් ගතවූ පසු ය. ක්‍රි.ව. 1 වන සියවස අග දක්වා කාලයට අයත් ඉන්දියාවේ කැටයම්වල පවා බුදුරදුන් වෙනුවට භාවිත කොට තිබෙන්නේ වජ්‍රාසනය, පද්මය, සිරිපතුළ, බෝධිය, ධර්මචක්‍රය හෝ ස්තූපය වැනි සංකේතයකි. කණිෂ්ක රජ සමයෙහි (ක්‍රි.පූ. 1 සියවස) ඉන්දියාවේ ගන්ධාරයෙහි හෝ මථුරාවෙහි ග්‍රීක හා රෝම කලා ආභාසය ලැබ මුල් ම බුදු පිළිමය නිර්මාණය කරන්නට ඇතැයි පිළිගනු ලැබේ. ලංකාවේ දේවානම්පියතිස්ස රජු විසින් (ක්‍රි.ව. 3 සියවස) ථූපාරාමයෙහි ගල් පිළිමයක් පිහිට වූ බව මහාවංසය කියයි. ඉන්පසු කීප අවස්ථාවක දී ම මෙම ශිලා පිළිමය ගැන මහාවංසයේ සඳහන් වෙයි. මෙය සත්‍යයක් ලෙස ගතහොත් මුල් ම වාර්තාගත බුදු පිළිමය නිර්මාණය කොට ඇත්තේ ලංකාවේ ය. එහෙත් උගතුන් සාමාන්‍යයෙන් පිළිගන්නේ බුදුපිළිමය ඉන්දියාවේ ආරම්භ වූ බවයි.



අභය මුද්‍රාව

(i)

බුදු පිළිම හිඳීම, හිට ගෙන සිටීම, සැතපීම හා සක්මන් කිරීම (ඇවිදීම) යන ඉරියවු සතරෙන් ම දක්නට ඇත. ඒවා පිළිවෙළින් හිඳි පිළිම, හිටි පිළිම, ඔත් පිළිම හා සක්මන් පිළිම ලෙස දක්වනු ලැබේ. බුද්ධ ප්‍රතිමාවක දක්නට ඇති සැලකිය යුතු ලක්ෂණ දෙකක් නම් මුද්‍රාව හා ආසනයයි. මුද්‍රාව නම් අත් හා ඇඟිලි හසුරුවන ආකාරය මගින් දක්වන අදහසයි. බුදු පිළිමවල බහුල ව දක්නට ලැබෙන මුද්‍රා අතර, i. **අභය** මුද්‍රාව (බියවීමට හේතුවක් නැති බව සංකේතවත් කිරීම.) ii. **විතර්ක** මුද්‍රාව (දහම් දෙසන බව සංකේතවත් කිරීම.), iii. **ධර්මචක්‍ර** මුද්‍රාව (ප්‍රථම ධර්ම දේශනාවෙහි දී ධර්මයෙහි බලය සංකේතවත් කිරීම) iv. **භූමිස්පර්ශ** මුද්‍රාව (තම බුද්ධත්වයට මහ පොළොව සාක්ෂ්‍ය දරන බව පෙන්වීම් වස් බිමට අත යොමු කිරීම) v. **ධ්‍යාන** මුද්‍රාව (භාවනානුයෝගී වීම) හා vi. **වරද** මුද්‍රාව (ශ්‍රේෂ්ඨ වූ නිවන ලබාදීම) වේ. ආසන නම් හිඳ ගන්නා ක්‍රමයයි. බුදු පිළිම සඳහා යොදා ගෙන ඇති ආසන වර්ග සතරක් වේ. එනම්, i. **පද්මාසන** (පද්මයක් හා සමාන ව හිඳීම), ii. **වජ්‍රාසන** (බුද්ධත්වයට පත්වන අවස්ථාවේ වජ්‍රාසනයෙහි වැඩ හිඳීම), iii. **වීරාසන** (වම්පාදය මත දකුණු පාදය සිටින සේ හිඳ ගැනීම) හා iv. **භද්‍රාසන** (උස් අසුනක දෙපා පහළට හෙළා හිඳ ගැනීම) යනුවෙනි.



විතර්ක මුද්‍රාව


(ii)




(iii)

ධර්මචක්‍ර මුද්‍රාව

බුදුපිළිමය ලෝකයේ විවිධ බෞද්ධ රටවල විවිධ ස්වරූපයෙන් හා විවිධ ප්‍රමාණයෙන් දක්නට ලැබේ. ලංකාවේ අවුකන පිළිමය හා මාලිගාවිල පිළිමය ඉතා විශාල හිටි පිළිම වේ. මධ්‍ය ආසියාවේ බාමියාන්හි පිළිමය ද මෙබඳු විශාල හිටි පිළිමයකි. පොළොන්නරු ගල් විහාරයෙහි සැතපෙන බුදු පිළිම පිළිබඳ ඉපැරැණි නිදසුනක් ද, පොළොන්නරුවෙහි තිවංක පිළිම ගෙයි ඇවිදින ඉරියව්වෙන් යුතු බුදු පිළිමයක් ද දක්නට ඇත.





හිඳි පිළිම අතර ලංකාවේ අනුරාධපුරයෙහි අභයගිරියේ සමාධි ප්‍රතිමාව ලෝකයේ ම විශිෂ්ට ගණයේ ප්‍රතිමාවක් ලෙස සැලකේ. වීරාසනයෙන් වැඩ සිටින මෙම පිළිමය ධ්‍යාන මුද්‍රාවෙන් යුක්ත ය. මහ ගත්කරු මාර්ටින් වික්‍රමසිංහ මහතා මෙම ප්‍රතිමාවේ 'නිවන් මුහුණුවර' දක්නට ඇතැයි කීය. ඉන්දියාවේ අගමැති ව සිටි ශ්‍රී නේරු තුමා සිරගෙයි සිටිය දී තම කුටිය තුළ මෙම සමාධි පිළිමයෙහි ඡායාරූපයක් තබා ගෙන සිටි බවත් ඉන් විශාල අස්වැසිල්ලක් ලද බවත් කියා ඇත. බුදු පිළිමයෙහි අදහස වනුයේ හුදු ප්‍රතිමා වන්දනය නොව බුදුරදුන්ගේ මහා කරුණාව, මහා ප්‍රඥාව වැනි ගුණ නිරූපනය කිරීම ය. එමගින් එම පිළිම දකින්නා තුළ මානසික සංයමයක් ද, සහනයක් ද ඇතිවේ. සාමකාමී මනසකින් යුත් බෞද්ධ සමාජයක් බිහි කිරීම සඳහා බුදු පිළිම මගින් කරනු ලබන බලපෑම විශාල ය.



පද්මාසන | වීරාසන | වජ්‍රාසන | භද්‍රාසන

## 6.2.4 සඳකඩ පහණ

ගොඩනැගිල්ලකට පිවිසෙන දොරටුවෙහි පියගැට පෙළ ආරම්භයෙහි දක්නට ලැබෙන අඩ සඳක් වැනි (=සඳකඩ) ගල (=පහණ) සඳකඩ පහණ යැයි කියනු ලැබේ. ගොඩනැගිල්ලට පිවිසීමට පෙර පා පිස දැමීම සඳහා භාවිත වූ මෙය සඳහා ඇතැම් ස්ථානයක හුදු අඩ සඳක් වැනි ගල් ලෑල්ලක් පමණක් දක්නට ඇති අතර, එය ක්‍රමයෙන් කලාත්මක බවින් වැඩී ගොස් අගනා කැටයම් නිර්මාණයක් බවට පත්ව ඇත.



සඳකඩ පහණ

දැනට ලංකාවෙහි සොයා ගෙන ඇති අගනා ම සඳකඩ පහණ වලින් එකක් දක්නට ලැබෙන්නේ අනුරාධපුර බිසෝ මාලිගය අසල ය. පිටත සිට ඇතුළට යන සේ බැලුවහොත් එහි මුලින් ම ගිනිදළු ද, ඉන්පසු ඇතා, අශ්වයා, ගවයා හා සිංහයා යන පිළිවෙළින් සත්ත්ව රූප ද, ඉන්පසු සංකීර්ණ ලිය වැලක්ද, ඉන්පසු හංස පෙළක් ද, නැවත සරල ලියවැලක් ද වේ. මධ්‍යයෙහි නෙලුම් මලක් ඇත.

මෙම නිර්මාණයෙහි ඇති සංකේතවල කිසියම් අර්ථයක් ඇති බව බොහෝ උගතුන්ගේ අදහස වේ. සෙනරත් පරණවිතාන මහතාගේ අදහස වන්නේ සමස්ත නිර්මාණයෙන් සංසාරයෙන් එතෙරවීම සංකේතවත් කරන බවයි. ඒ අනුව ගිනි දැල්ලෙන් කෙලෙසුන් ද, සතුන් සතර දෙනාගෙන් ජාති ජරා ව්‍යාධි මරණ (ඉපදීම, වයසට යාම, ලෙඩවීම හා මරණය) යන සතර සාංසාරික බය ද සංකීර්ණ ලියවැලෙන් තණ්හාව ද හංසයාගෙන් සසර බියෙන් මිදී නිවන කරා යන සත්ත්වයා ද සරල ලියවැලෙන් තුනී වූ තණ්හාව ද නෙලුම් මලෙන් සසරින් එතෙර වීම වන නිවන හෝ ශුද්ධාවාස බ්‍රහ්මලෝකය ද නිරූපණය වේ. ඒ අනුව සැදැහැවතකු බුදු මැදුරට පිවිසීම සසරින් එතෙර වී නිවන් දැකීමට සමාන ලෙස මෙයින් දැක්වෙන බව එතුමාගේ අදහසයි.

පරණවිතාන මහතාගේ මෙම අර්ථකථනය නිර්මාණාත්මක වුවත් එබඳු නිර්මාණයක් කෙනකුගේ පයට පෑගෙන ස්ථානයක තබනු ඇද්ද යන සැකය මතු වේ. හින්දු ආගමික බලපෑම කැපී පෙණුනු පොළොන්නරු යුගයෙහි සඳකඩ පහණවලින් ගවරූපය ඉවත් කොට තිබීම මෙයට නිදසුනක් සේ දක්වනු ලැබේ. සඳකඩ පහණෙහි අර්ථය කවරක් ද යන්න පිළිබඳ එකඟතාවක් උගතුන් අතර නොපැවතුණ ද එය සිංහල කැටයම් කලාවෙහි විශිෂ්ට නිර්මාණයක් බවට සැකයක් නැත.

## 6.2.5 චිත්‍රකලාව

චිත්‍රකලාව බෞද්ධ සංස්කෘතියෙහි ඉතා වැදගත් අංගයක් බව අතීතයෙහි සිට නො නැසී පවත්නා චිත්‍ර සමූහය දෙස බැලීමෙන් පැහැදිලි වේ. දනට හොඳින් ආරක්ෂා වී ඇති ඉපැරණි ම චිත්‍ර අතර සීගිරි කාන්තාවන්ගේ චිත්‍ර ලෝකයේ ම ප්‍රකට ය. ඉන් නිරූපණය වන්නේ බුදුන් වැඳීමට යන රාජකීය කාන්තාවන් හා ඔවුන්ගේ සේවිකාවන් බව මේ චිත්‍ර සම්බන්ධ එක් මතයකි. සීගිරි කාන්තා චිත්‍ර හැරෙන විට අපට ඇති අනෙකුත් චිත්‍ර සියල්ල ම පාහේ විහාරස්ථානවල බුදු මැදුරෙහි හා අවට ඇඳ ඇති ආගමික භක්තිය උපදවන නිර්මාණ වේ. පොළොන්නරු තිවංක පිළිම ගෙයි දක්නට ඇති නටබුන් වූ චිත්‍ර දනට ඇති ඉපැරණි ම බෞද්ධ චිත්‍ර ලෙස සලකනු ලැබේ. දඹුලු විහාරයෙහි ඇති චිත්‍ර විටින් විට ප්‍රතිසංස්කරණය කොට ඇතත්, තවමත් ඉපැරණි ස්වරූපය ආරක්ෂා වී ඇති චිත්‍ර නිධානයක් ලෙස හැඳින්විය හැකි ය. ගම්පොළ යුගයේ සිට මහනුවර යුගය තෙක් කාලයට අයත් චිත්‍ර දෙගල්දොරුව, බඹරගල හා රිදී විහාරය වැනි ස්ථානයන්හි දක්නට ඇත. බුද්ධ චරිතය, ලංකා ඉතිහාසය, ජාතක කථා ආදිය විහාර චිත්‍රවල තේමා වේ. ආගමික ශ්‍රද්ධාව ප්‍රේක්ෂයා තුළ ඇති කරවීම හා ධාර්මික විනෝදාස්වාදය ලබාදීම පමණක් නොව සදාචාර සංවර්ධනය ද මෙම චිත්‍ර කලාවෙහි පරමාර්ථය විය.

## 6.2.6 සාරාංශය

සිංහල බෞද්ධ කලා ශිල්ප යනු කිසිසේත් ම ස්තූපය, බුදුපිළිමය හා සඳකඩ පහණ පමණක් නො වේ. අප මෙහි දී සාකච්ඡා කළ දැට වඩා සාකච්ඡා නො කළ දෑ අධික ය. නිදසුන් ලෙස දේවතාරූප හා මුරගල් වැනි මූර්ති ද, කොරවක්ගල වැනි කැටයම් ද, විහාර මන්දිර වැනි වාස්තු විද්‍යාත්මක කරුණු ද මෙහි සාකච්ඡා කර නැත. කැටයම් යන වචනයෙහි නියම තේරුම වන ලී කර්මාන්ත හෙවත් ලීයෙන් කළ අගනා කලා නිර්මාණ රාශියක් අප සතු ව ඇත. විශේෂයෙන් ම මහනුවර හා තදාසන්න ප්‍රදේශවල පිහිටි ගම්පොළ යුගයට අයත් ඇම්බැක්ක දේවාලයේ හා දළදා මාළිගාවේ ද වෙනත් විහාරස්ථාන හා දේවාලවල ද ඇති ලී කැටයම් ඉතා විශිෂ්ට ගණයේ ලා සැලැකේ. මේ සියල්ලෙන් පෝෂිත සිංහල බෞද්ධ කලාශිල්ප වූ කලී මහින්දාගමනයෙන් අප ලත් අගනා දායාදයකි.

**අභ්‍යාස**

1. චෛත්‍යය හා ස්තූපය යන වචනවල නිවැරදි භාවිතය පැහැදිලි කරන්න.
2. ස්තූපයක ආකෘති වර්ග නම් කොට හඳුන්වන්න.
3. බුදු පිළිමයක මුද්‍රා හා ආසන වර්ග පැහැදිලි කරන්න.
4. විහාරස්ථානයකට ගිය විට ත්‍රිවිධ චෛත්‍ය වඳින අනුපිළිවෙළ දක්වන්න.
5. දාගැබක ආකෘතියක් ඇඳ එහි කොටස් නම් කරන්න.
6. සඳකඩ පහණ පිළිබඳ ව පරණවිතාන මහතා ඉදිරිපත් කරන සංකේත අර්ථය පැහැදිලි කරන්න.

**පැවරුම්**

1. ස්තූප ආකෘති පිළිබඳ ව ඔබට ලබාගත හැකි නිදසුන් ඔබේ සටහන් පොතට එකතු කර ගන්න.
2. බුදු පිළිම පිළිබඳ තුන් ඉරියව්ව හස්ත මුද්‍රා හා ආසන පැහැදිලි වන සේ රේඛා චිත්‍ර අඳින්න.

## 6.3 මහින්දාගමනයේ දායාද: බෞද්ධ සාහිත්‍යය

### 6.3.1 හැඳින්වීම

මිහිඳු මහ රහතන් වහන්සේ විසින් බුදුදහම මේ රටට හඳුන්වා දීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලාංකික සංස්කෘතියට පොදුවේත්, සිංහල ජනතාවට විශේෂයෙනුත් ලැබුණු දායාද ඉමහත් ය. ලේඛන කලාව ආරම්භ වී ක්‍රමයෙන් පාලි, සංස්කෘත හා සිංහල භාෂාවලින් බෞද්ධ සාහිත්‍යයක් මේ රටෙහි බිහි වී දියුණු වීම එසේ ලැබුණු එක් අගනා දායාදයකි. මේ පාඩම් ඒකකයෙන් අප උත්සාහ දරනුයේ ක්‍රි.පූ. තුන්වන සියවසෙහි පටන් අද දක්වා පවත්නා මෙම සාහිත්‍ය උරුමය පිළිබඳ අවබෝධයක් ලබා ගැනුමට ය. ශ්‍රී ලාංකික බෞද්ධ සාහිත්‍යය පාලි, සංස්කෘත හා සිංහල යන භාෂා තුනකින් පැවතුණ ද, මෙහි දී අපගේ අවධානය යොමු වනුයේ සිංහල බෞද්ධ සාහිත්‍යය කෙරෙහි ය.

### 6.3.2 සිංහල බෞද්ධ සාහිත්‍යයෙහි ආරම්භය

විධිමත් ලේඛන කලාවක් පිළිබඳ ව අප රටෙහි මෙතෙක් ලැබී ඇති පැරැණි ම සාක්ෂ්‍ය මහින්දාගමනයට පසු කාලයට අයත් ය. ආදිම ශිලා ලේඛනවල දක්නට ඇති අකුරු ඉන්දියාවේ ඉපැරැණි බ්‍රාහ්මී අක්ෂරවලට ඉතා සමාන ය. භාෂාව ද අශෝක රජුගේ සෙල්ලිපි භාෂාවට බොහෝදුරට සමාන ය. මේ අනුව අපගේ ලේඛන කලාව ඉන්දියාවෙහි බලපෑම ඇති ව මහින්දාගමනයෙන් පසු දියුණු වූ බව නිගමනය කළ හැකි ය.

මිහිඳු හිමියන් හුදෙක් බුදුදහම අප රටට ගෙනාවා පමණක් නොවේ. උන්වහන්සේ මේ රටට බෞද්ධ සංස්කෘතියක් ද ගෙන ආහ. එහි එක් වැදගත් අංගයක් වනුයේ බෞද්ධ සාහිත්‍යයයි. ත්‍රිපිටක ධර්මය කටපාඩමින් දත් ධර්මධර භික්ෂූන් වහන්සේලා මිහිඳු හිමියන් සමග මෙහි වඩින්නට ඇත. එම භික්ෂූන් ත්‍රිපිටකය පමණක් නොව එම පිටකවල එන ධර්ම විනය කරුණු අර්ථකථනය කරන (තේරුම් ගන්නා) ආකාරය ද ලංකාවට ගෙන ආහ. ඒවා අටුවා හෙවත් අට්ඨකථා නම් වේ.

බුදුසසුන ඉතා ඉක්මනින් ලංකාවෙහි පැතිර ගිය අතර බොහෝ දෙනෙක් පැවිදි වූහ. මෙසේ පැවිදි වූ පිරිස ධර්මය හා විනය ඉගෙන ගත් අතර, එම ඉගෙනීම කරන ලද්දේ සිංහල භාෂාවෙන් ය. එහෙයින් අලුත් දහමක් කියා දීමට යාමේ දී පාලි වචන සමූහයක් සිංහල භාෂාවට එකතු විය. එමඟින් භාෂාව පෝෂණය විය. ගැඹුරු කරුණු ගැන සිතීමේ දී චින්තනය දියුණු වන අතර, එසේ වීමේ දී භාෂාව නිරායාසයෙන් ම දියුණු වේ. ඒ ආකාරයෙන් ම, බුදුදහම හැදෑරීමෙන් සිංහල ජනතාවගේ චින්තනය දියුණු වූ අතර, චින්තනය දියුණු වීමෙන් සිංහල භාෂාව ද දියුණු විය.

පැරණි සිංහල සාහිත්‍යය හැදෑරීමේ දී රටෙහි රාජ්‍ය පාලන යුග අනුව සාහිත්‍ය යුග ද බෙදා දක්වනු ලැබේ.

| යුගය | කාල සීමාව |
|---|---|
| අනුරාධපුර යුගය | ක්‍රි.පූ. 543 සිට ක්‍රි.ව.1058 තෙක් |
| පොළොන්නරු යුගය | ක්‍රි.ව. 1058 සිට ක්‍රි.ව.1234 තෙක් |
| දඹදෙණි යුගය | ක්‍රි.ව. 1220 සිට ක්‍රි.ව.1293 තෙක් |
| කුරුණෑගල යුගය | ක්‍රි.ව. 1293 සිට ක්‍රි.ව.1347 තෙක් |
| ගම්පොළ යුගය | ක්‍රි.ව. 1347 සිට ක්‍රි.ව.1412 තෙක් |
| කෝට්ටේ යුගය | ක්‍රි.ව. 1412 සිට ක්‍රි.ව.1580 තෙක් |
| සීතාවක යුගය | ක්‍රි.ව. 1530 සිට ක්‍රි.ව.1592 තෙක් |
| මහනුවර යුගය | ක්‍රි.ව. 1480 සිට ක්‍රි.ව.1815 තෙක් |
| කොළඹ යුගය (නූතන යුගය) | ක්‍රි.ව. 1815 සිට වර්තමානය තෙක් |

අනුරාධපුර යුගයෙහි සාහිත්‍යය ඉතා උසස් මට්ටමක පැවැති බවට වාර්තා පැවතිය ද අප සතුව අද වන විට ඉතිරි ව ඇත්තේ පාලි කෘති හැරෙන විට සිංහල භාෂා කෘති කීපයක් පමණි. මගධ බසින් පැවැති ත්‍රිපිටක ධර්මය තේරුම් ගැනීම සඳහා සකස් කරන ලද අට්ඨකථා ද බෞද්ධ පූජනීය වස්තු වූ මහාබෝධිය, මහා ස්තූපය (රුවන්වැලි සෑය), දළදා වහන්සේ වැනි පූජනීය වස්තු වටා ගොඩ නගන ලද වංශකථා සාහිත්‍යය ද දිවයිනෙහි ඉතිහාසය විස්තර කරමින් ලියන ලද දීපවංශය හා මහාවංශය ඇතුළු ඉතිහාස වංශ කථා ද ආරම්භයෙහි පැවැතියේ සිංහල භාෂාවෙනි. සිංහල භාෂාවෙන් තිබූ අට්ඨකථා " හෙළ අටුවා" නමින් හැඳින්විණි. ආරම්භයෙහි සිංහල භාෂාවෙන් පැවැති මෙම පොත් දිවයිනෙන් බැහැර බෞද්ධයන්ගේ ද ප්‍රයෝජනය පිණිස පාලි භාෂාවට පරිවර්තනය කරන ලදී.

මෙම පරිවර්තනත් සමඟ අධ්‍යාපනික හා ආගමික භාෂාව පාලි බවට පත් වූ අතර, මූලික ව සිංහල භාෂාවෙන් පැවැති කෘති තරමක් දුරට අභාවයට ගියේ ය. මේ අනුව හෙළ අටුවා කෘති කිසිවක් අද අපහට ඉතිරිව නැත. වංශකථාවල මුල් කෘති ද අභාවයට ගොසිනි. දැනට දක්නට ඇති බෝධිවංශය, ස්තූපවංශය ආදිය පාලි පොත්වලින් නැවත සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද කෘති ය.

### 6.3.3 පද්‍ය සාහිත්‍යය

අනුරාධපුර යුගයට අයත් ඉපැරැණි ම පද්‍ය අපට ලැබෙන්නේ සීගිරියේ කුරුටු ගීවලිනි. හයවන සියවසෙහි රජ කළ පළමු කාශ්‍යප රජු (ක්‍රි.ව. 526 552) සීගිරිය තම වාසස්ථානය කොට විසුවේ ය. පසු කාලයේ දී එය මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කරන ලද බව පෙනේ. ක්‍රි.ව. 700 900 අතර කාලයේ දී මෙම ස්ථානය බැලීමට දිවයිනේ නන් දෙසින් පැමිණියන් විසින් එහි කැටපත් පවුරෙහි ගී කුරුටු ගා ඇත. (හිටපු පුරාවිද්‍යා කොමසාරිස්වරයකු වූ මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා මෙම සීගිරි ගී 685ක් කියවා ප්‍රකාශයට පත් කොට ඇත.) මෙම ගී පැරැණි ලංකාවේ සංස්කෘතිය හා සමාජය තේරුම් ගැනීම සඳහා මහඟු දායකත්වයක් ලබා දේ. බොහෝ පද්‍ය සුන්දර කාව්‍යමය නිර්මාණ ද වේ.

අනුරාධපුර යුගයෙන් අපට ඉතිරි ව ඇති එක ම පද්‍ය කෘතිය **සියබස්ලකරයි**. එය සාහිත්‍ය රචනය සඳහා උපදෙස් දෙන්නකි. එහි ඇති එක් උපදෙසක් **"පෙදෙන් බුදු සිරිතැ"** යනුයි. එනම් බුද්ධ චරිතය කීම සඳහා පද්‍ය මාධ්‍යය භාවිත කළ යුතු බවයි. මෙම උපදේශය පරිදි සිංහල කවියන් බෝධිසත්ත්ව කථා ඇතුළත් ජාතක පොතෙන් තම පද්‍ය කෘති සඳහා කථාවස්තු සොයා ගත් බව පෙනේ. පොළොන්නරු යුගයෙන් අපට ලැබෙන **මුවදෙව්දාව** මඛාදේව ජාතකය ද **සසදාව** සස ජාතකය ද දඹදෙණි යුගයට අයත් **කව් සිළුමිණ** කුස ජාතකය ද පදනම් කොට රචනා කොට ඇත. කෝට්ටේ යුගයෙහි තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් ලියූ **කාව්‍යශේඛරය** සත්තුභත්ත ජාතකය ඇසුරින් ලියා ඇති අතර, එම යුගයට ම අයත් වෑත්තෑවේ හිමියන් ලියූ **ගුත්තිලය** ගුත්තිල ජාතකය ඇසුරින් ලියා ඇත. ඉන්පසු මහනුවර යුගයෙහි අවසානය තෙක් ද ඉන් ඔබ්බට ද මෙම සම්ප්‍රදාය පැවැති බව පෙනේ.

සාහිත්‍ය රසයට වඩා ධර්ම රසයට, උපදේශයට හා සදාචාරයට මුල් තැන දුන් පද්‍ය සාහිත්‍යයක් ද පැරැණි කාලයෙහි සිට ම අපට උරුම ය. කෝට්ටේ යුගයෙහි දී වීදාගම මෛත්‍රේය හිමියන් විසින් ලියන ලද **බුදුගුණාලංකාරය** හා **ලෝවැඩ සඟරාවත්** සීතාවක යුගයට අයත් අලගියවන්න මුකවෙටි තුමාගේ **සුභාෂිතයත්** මහනුවර සමයට අයත් රණස්ගල්ලේ හිමියන්ගේ **ලෝකෝපකාරයත්** මේ ගණයට අයත් මූලික කෘති ය.

මෙබඳු පද්‍ය කෘති මහින්දාගමනයෙන් ලැබුණු ආගමික දායාදය අප සමාජයෙහි තහවුරු කිරීම සඳහා ඉවහල් විය.

## 6.3.4 ගද්‍ය සාහිත්‍යය

සිංහල බෞද්ධ ගද්‍ය සාහිත්‍යයට අයත් කෘති රාශියක් අනුරාධපුර යුගයෙහි පැවැති බවත් ඒවා පාලි භාෂාවට පරිවර්තනය කරන ලද බවත් අපි දනිමු. අනුරාධපුර යුගයෙන් දැනට අපට ඉතිරි ව ඇත්තේ පාලි ධර්ම හා විනය ග්‍රන්ථවල දුෂ්කර වචන පැහැදිලි කරමින් ලියා ඇති **ගැටපද** සහ පාලි ග්‍රන්ථවලට සිංහලෙන් අර්ථ දැක්වීම සඳහා ලියා ඇති **සන්‍ය** (සන්න) ග්‍රන්ථත් පමණි. **දම්පියා අටුවා ගැටපදය** හා **සිඛවලඳ විනිස** නිදසුන් ය. සිංහල භාෂාවෙන් ලියා ඇති සාහිත්‍යමය අගයකින් යුත් ගද්‍ය කෘති අපට මුලින් ම හමුවන්නේ පොළොන්නරු යුගයෙනි. ගුරුළුගෝමී පඬිතුමා විසින් බුද්ධචරිතය පසුබිම් කොට පුරිසදම්මසාරථී ගුණය විස්තර කරමින් ලියා ඇති **අමාවතුර** හා බුදුදහම විස්තර කරමින් ලියා ඇති **ධර්මප්‍රදීපිකාව** විශිෂ්ට ගණයේ ගද්‍ය කෘති දෙකකි. ගුරුළුගෝමීන්ගේ **අමාවතුර** පැරැණි ලංකාවෙහි සිංහල භාෂාවෙන් රචිත ශ්‍රේෂ්ඨතම හා පැරැණිතම ගද්‍ය කාව්‍යය ලෙස සැලකේ.

සිංහල ගද්‍ය කාව්‍ය සාහිත්‍යය දියුණු වූයේ බණකථා සාහිත්‍යයක් ලෙසට ය. කියවීම සඳහා පොතපත දුර්ලභ වූ අවදියක සමූහ වශයෙන් සවන්දීම සඳහා සකස් කරන ලද මෙම කෘතිවල පරමාර්ථය වූයේ ජනතාව යහ මඟට යොමු කරවීම ය. දඹදෙණි යුගයට අයත් **බුත්සරණ, දහම් සරණ** හා **සඟ සරණ** මේ ගණයෙහි ලා සැලකිය හැකි අගනා කෘති තුනකි.

මෙම ගණයට අයත් කෘති අතර, දඹදෙණි යුගයට අයත් ධර්මසේන හිමියන්ගේ **සද්ධර්ම රත්නාවලිය**, මයූරපාද හිමියන්ගේ **පූජාවලිය**, දෙවන ධර්මකීර්ති හිමියන් විසින් ලියන ලද **සද්ධර්මාලංකාරය** ද වේ. පැරැණි සිංහල සාහිත්‍යයෙහි මේ ගණයට අයත් වැදගත් ම කෘතිය වන්නේ කුරුණෑගල යුගයට අයත් **පන්සිය පනස් ජාතක පොතයි**. "ජාතක පොත් වහන්සේ"ලෙස ගෞරවාකාරයෙන් හැඳින්වෙන මෙම කෘතිය තරම් සිංහල ජන ජීවිතයට බල පා ඇති වෙනත් කෘතියක් නැත. මෙහි බුදුරදුන්ගේ අතීත ජීවිතවල සිද්ධි ඇතුළත් කතාන්තර පන්සිය හතළිස් හතක් (547) ඇත. සිංහල බෞද්ධ ජනතාව ජාතක පොත ඇතුළු මෙම කෘතිවලට සමූහ වශයෙන් සවන් දී ධර්ම උපදේශ මෙන්ම ධාර්මික විනෝදාස්වාදය ද ලැබූහ. සිංහල බෞද්ධ සංස්කෘතිය සකස් කිරීමෙහි ලා මෙම සාහිත්‍යය තුළින් සිදු ව ඇති සේවාව ඉමහත් ය.

කෝට්ටේ යුගයෙහි පටන් සිංහල සාහිත්‍යය සන්දේශ කාව්‍ය, හටන් කවි (යුද්ධ වර්ණනා) ආදී හුදෙක් බෞද්ධ ම නොවන සාහිත්‍ය අංග එකතු කර ගනිමින් විවිධ නව මං ඔස්සේ විහිදුණි.

හුදු ආගමික අවශ්‍යතාවලින් ඔබ්බට ගොස් ජාතික අවශ්‍යතා සඳහා ද සාහිත්‍යය යොදා ගනු ලැබීම මෙම නව ප්‍රවණතාවලින් පැහැදිලි විය. මහනුවර යුගය වන විට හින්දු ආගමෙහි හා ක්‍රිස්තියානි ආගමෙහි ද ආභාසය යටතේ මෙම විවිධත්වය තව ද වර්ධනය විය. කොළඹ යුගයෙහි දී යුරෝපීය සාහිත්‍යයෙහි බලපෑම ද ඇති ව නවකථා, කෙටිකථා, නාට්‍ය වැනි නිර්මාණාත්මක අංග රාශියක් සිංහල සාහිත්‍යයට එකතුව ඇත.

ගද්‍ය හා පද්‍ය යන අංශවලින් දියුණුව පැවතිය ද පැරැණි සිංහල සාහිත්‍යය නාට්‍ය අංශයෙන් දියුණු වූ බවක් නො පෙනේ. නාට්‍යය අප සංස්කෘතියෙහි ජනප්‍රිය අංගයක් වූයේ දකුණු ඉන්දීය බලපෑම මත 19 වන සියවස පමණ සිට ය. එසේ ජනප්‍රිය වූ නාඩගම් සඳහා මනමේ කථාව, සඳකිඳුරු ජාතකය වැනි බෞද්ධ කතාන්තර ක්‍රමයෙන් යොදා ගන්නා ලදී. පසුකාලයෙහි මනමේ නාට්‍යය නිර්මාණය කළ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා නාඩගම් සම්ප්‍රදායයෙන් බොහෝ ආභාසය ලැබූ බව පෙනේ. කෙසේ වෙතත්, අද වන විට නවකථාකරුවන්, කෙටිකථාකරුවන් හා කවීන් පමණක් නොව නාට්‍යකරුවන් ද බෞද්ධ ඉගැන්වීම්වල ආභාසය ලබමින් බෞද්ධ තේමා හා කථාවස්තු යොදා ගනිමින් තම නිම්වළලු පුළුල් කරගනු පෙනේ.

## 6.3.5 සාරාංශය

ශ්‍රී ලංකා බෞද්ධ සාහිත්‍යයෙහි ආරම්භය හා විකාශය පිළිබඳ ව මේ පාඩම් ඒකකයේ දී අපි හැදෑරුවෙමු. ශ්‍රී ලාංකික බෞද්ධ සාහිත්‍යය අනුරාධපුර යුගයෙන් පසු ප්‍රධාන වශයෙන් සිංහල (භාෂා මාධ්‍ය) බෞද්ධ සාහිත්‍යයක් ලෙස දියුණු වූ අයුරුත්, ඒ තුළ ආගමික, සදාචාර හා කලාත්මක පරමාර්ථ මනා සේ මිශ්‍රවීමෙන් සමතුලිත සාහිත්‍යයක් අප රටෙහි දියුණු වූ අයුරුත් ඉගෙන ගත්තෙමු.

### අභ්‍යාස

1. සිංහල සාහිත්‍ය යුග පිළිවෙළින් නම් කරන්න.
2. පැරැණි සාහිත්‍යයට අයත් ප්‍රධාන පද්‍ය කෘති සතරක් හා ගද්‍ය කෘති සතරක් ද දක්වන්න. ඒවායෙහි කර්තෘවරුන් සඳහන් වේ නම් ඔවුන් ද දක්වන්න.
3. අනුරාධපුර යුගයෙහි තිබූ බවට සැලකෙන සිංහල කෘති ක්‍රමයෙන් අභාවයට යෑමේ හේතුව කුමක් ද?

### පැවරුම්

1. බුදු දහම හා බෞද්ධ සංස්කෘතිය අතර ඇති සබඳතාව ගුරුවරුන්ගෙන් අසා දැනගන්න.
2. පහත සඳහන් වචනවල තේරුම සොයා සටහන් පොතට එකතු කර ගන්න.
   i. ධර්මධර ii. අර්ථකථා iii. ප්‍රවණතා iv. ආභාසය
3. මෙම පාඩම් ඒකකයෙහි විස්තර කරන ලද සාහිත්‍ය කෘති අතර චරිත සංවර්ධනය සඳහා කෙළින් ම අදාළ වන කෘති කීපයක් නම් කොට හඳුන්වා දෙන්න.

### අතිරේක කියවීම්

1. ලක්දිව බුදුසමයේ ඉතිහාසය (වල්පොල රාහුල හිමි)
2. බුද්ධ ප්‍රතිමා කලාව සහ බුදුපිළිමයේ විකාශය, (බෙල්ලන්විල විමලරතන හිමි) (1995)
3. ස්තූප, (චන්ද්‍රා වික්‍රමගමගේ) (2000)